# ළමයින්ට සිදුවන හිංසනයන් පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා ඔබේ පෞද්ගලික මාර්ගෝපදේශකය

## ළමයින්ට එරෙහි හිංසනය යනු ....

ළමයින්ට එරෙහි හිංසනය ලොව පුරා විශාල සහ කුඩා ප්‍රජාවන් වල, නගරවල සහ දුෂ්කර ප්‍රදේශවල සිදු වේ.

"ළමයින්ට එරෙහි හිංසනය" යන්නට විවිධාකාර අරුත් ඇත. කායික අපයෝජනය, වාචික අපයෝජනය, ලිංගික අපයෝජනය සහ නොසලකා හැරීම ඉන් කිහිපයකි.




කුමන ආකාරයකින් හෝ ළමයින්ට සිදුවන හිංසනය නිසා ළමයාගේ ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික සෞඛ්‍යයට දිගුකාලීනව ඍණාත්මක බලපෑම් ඇති වීම අනිවාර්ය වේ. දරුවන්ට එරෙහි හිංසනයේ විවිධ වර්ග පිළිබඳව ඔබ දැනගෙන සිටීම වැදගත් වන්නේද එහෙයිනි. මෙම පෞද්ගලික මාර්ගෝපදේශකය එයට උපකාරී වේ.

දරුවන්ට එරෙහි හිංසනය ඕනෑම තැනකදී සිදුවිය හැකි බව ඔබ දැනගෙන සිටියාද? මේ පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කරන ලද අධ්‍යයනයකදී දරුවන් හිංසනය අත්දකින විවිධ ස්ථාන 5ක් හඳුනාගෙන ඇත. ඒවා නම් නිවස සහ පවුල, පාසල සහ අධ්‍යාපන වටපිටාවන්, ආරක්ෂාව සහ යුක්තිය පිළිබඳ වටපිටාවන්, සේවා වටපිටාවන් සහ ප්‍රජාව වේ.

දැන් ඔබ දන්නවා ළමයින්ට එරෙහිව හිංසනයන් පිළිබඳව සහ එය සිදුවන ස්ථාන පිළිබඳව. අපි මෙහි විවිධ ආකාර සොයා යමු.

### ළමා ශ්‍රමිකත්වය

ළමා ශ්‍රමිකත්වය නිර්වචනය කරන්නේ කායිකව හානිදායක වූ, ළමයින්ගේ ළමා කාලය ඔවුන්ට අහිමි කරන හෝ ළමයින්ව සිය උපරිම විභවතාවයට ළඟාවීමෙන් වළක්වාලන ක්‍රියාවකි. දරුවන්ට වැඩෙහි යෙදීමට බල කිරීමට සහ වැඩ කරවීමට හිංසනය නිරතුරුවම භාවිතා කරයි. ලොව පුරා මිලියන 215ක් ළමයින් ළමා ශ්‍රමිකයින් බවට පත් වී ඇති බව ගණන් බලා ඇත.

### ළමා ජාවාරම

සූරාකෑමේ අරමුණින් ළමයෙකු බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම සහ ආරක්ෂාව සැලසීම ළමා ජාවාරම වේ. දුක්ඛිත තත්වය වන්නේ ජාවාරම් කරන ලද ළමයින් නිරන්තරයෙන් ශ්‍රමිකයන් වශයෙන් ලිංගික කටයුතු සඳහා සහ / හෝ මත්ද්‍රව්‍ය වෙළෙඳාමට යොදවා ගැනීමයි.

## ළමා විවාහ

දුප්පත් සහ දුෂ්කර බොහෝ ප්‍රජාවන්වල ළමා විවාහ යනු සම්ප්‍රදායකි. ළාබාල ගැහැණු ළමයින් වයසින් බොහෝ වැඩිමහලු මිනිසුන්ට විවාහ කර දෙන්නේ ඔවුන් තම යහළුවන්ගෙන්, පවුලෙන් සහ අධ්‍යාපනික අවස්ථාවන්ගෙන් වෙන් කරමිනි. ගෘහස්ථ හිංසනය, අපරිණත ලිංගික ක්‍රියාකාරකම් හේතුවෙන් සහ දරු උපත්වලදී සෞඛ්‍ය ගැටළු ඇතිවීම ළමා විවාහවල ප්‍රතිඵල වේ.

ළාබාල වයසින් විවාහ කරදෙන ගැහැණු ළමයින් නිරන්තරයෙන්ම ඔවුන්ගේ පූර්ණ විභවතාවයට ළඟා වීමෙන් සහ දුප්පත්කමින් මිදීමේ හැකියාවෙන් දුරස් කරනු ලබයි.

## කායික අපයෝජනය



කායික අපයෝජනය යනු දරුවෙකුගේ ශරීරයේ කුමන හෝ කොටසකට සිතාමතා සහ බලහත 'කාරයෙන් කරන ක්‍රියාවකි.

දරුවෙකුට කම්පනයක්, හානියක් හෝ තුවාලයක් ඇති කරන ශරීරයේ කුමන හෝ කොටසකට සිතාමතා සහ බලහත්කාරයෙන් කරන ක්‍රියාවකි.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව දරුවන්ගෙන් 80%ක් කායික අපයෝජනය නිවසේදී අත්දකිති.

## වාචික අපයෝජනය

යටිගිරියෙන් කෑ ගැසීම, තර්ජනය කිරීම, නම් පට බැඳීම, නිරන්තරයෙන් විවේචනය කිරීම, ලැජ්ජාවට පත් කිරීම සහ සරදම් කිරීම වාචික අපයෝජනයේ විවිධ ස්වරූපයන්ය. ශාරීරික කැළැල් නොමැති වුවද, වාචික අපයෝජනයන්ට ගොදුරු වූ දරුවෙකුට ඉන් ප්‍රකෘති තත්ත්වයට පත්වීමට දිගු කාලයක් ගත වේ.

## මත්ද්‍රව්‍ය අපයෝජනය

ළමයින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යොදවා ගැනීම හෝ ඔවුන් මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි කරවීම එක්තරා ආකාරයක අපයෝජනයකි.මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් දුප්පත්කමින් පෙළෙන ආන්තික දරුවන් ගොදුරු කරගන්නේ ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවන්ට අපහසු අවස්ථා වලදී සහය දීමෙනි. මෙවන් අපයෝජන වලට නිරන්තරයෙන් ගොදුරුවන්නේ වීදි දරුවන්ය.

## ලිංගික අපයෝජනය

අපයෝජකයාගේ සතුට පිණිස සහ ලිංගික අරමුණු උදෙසා ළමයින්ට කරනු ලබන ඕනෑම ආකාරයක ලිංගික ක්‍රියාවක් ලිංගික අපයෝජනයක් ලෙස අර්ථ දක්වා ඇත. බොහෝ විට ලිංගිකව අපයෝජනයට පත් වූ ළමයින් එසේ අපයෝජනයට පත්කොට ඇත්තේ ඔවුන් දන්නා හඳුනන, විශ්වාසවන්ත, වගකීම් සහගත, ඔවුන් කෙරෙහි බලයක් සහිත පුද්ගලයන් විසිනි.

## ස්ත්‍රී පුරුෂ අසමානතාව

ස්ත්‍රී පුරුෂ අසමානතාව ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව ළමයින්ට හෝ වෙනස්කොට සැලකීම හෝ වෙනස්කොට දැකීම පිළිබඳ විස්තර කෙරෙන පුළුල් වදනකි. ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින් යන දෙපිරිසම මෙයට ගොදුරු විය හැකි නමුත් මෙම වදන බොහෝවිට භාවිතා කරනු ලබන්නේ ගැහැණු ළමයින් සම්බන්ධයෙනි. බොහෝ රටවල ගැහැණු ළමයෙකු වීම නිසා ඌණ පෝෂණ තත්ත්වය, අධ්‍යාපනය ලැබීමට අවස්ථා අඩුවීම, ලිංගිකව සූරාකෑම හෝ හානිදායක සම්ප්‍රදායන්ට පෙළඹවීමට ලක්වේ.

## අවධානම් හඳුනාගැනීම

ඔබට හිංසනයන්ගෙන් ආරක්ෂා වීමට ඇති එක් ආකාරයක් නම් අවධානම් අවස්ථාවන් හඳුනාගැනීමට සහ ඒවා වළක්වාගැනීමට ඉගෙන ගැනීමයි.

උදාහරණයක් ලෙස පැහැරගෙන යාමෙන් හෝ ළමා ජාවාරම්කරුවන්ට හසුවීමෙන් වැළකීමට හොඳ ආකාරයක් නම් අමුත්තන් සමඟ කථා නොකිරීම සහ ගමන් බිමන් නොයාමයි.

ප්ලෑන් වැනි සංවිධාන ළමයින්ට හිංසනයන්ගෙන් තමන්ව ආරක්ෂා කරගන්නා ආකාරය ගැන ඉගෙනගත හැකි තොරතුරු ලබාදෙන අතර වැඩසටහන් ද පවත්වයි.

ඔබව ආරක්ෂා කරගන්න. ඔබේ ප්‍රජාවේ වැඩසටහන් ගැන ඉගෙන ගන්න.

## එපා ! ඉවත් වන්න ! දැනුම් දෙන්න !

ඔබ, ඔබේ මිතුරෙකු හෝ ඔබේ පවුලේ සාමාජිකයෙකු ළමයින්ට එරෙහි හිංසනයකට මුහුණ දී ඇති විට ඔබ කළ යුත්තේ කුමක්ද?



පිළිතුර සරලයි.

**එපා ! ඉවත් වන්න ! දැනුම් දෙන්න !**

**එපා !**

ඔබට සලකන ආකාරයට ඔබ අකමැති බව සහ ඔබ ඔබේ අයිතින් දන්නා බව ඔබට හිංසා කිරීමට එන පුද්ගලයාට දැනෙන්නට හරින්න. අපයෝජකයාට පැහැදිලිව සහ ශබ්ද නගා එපා ! යැයි කියන්න.

**ඉවත් වන්න !**

මීළඟට වැදගත් වන්නේ අපයෝජකයාගෙන් ඉවත්වීමයි. අපයෝජනය සිදුවන ස්ථානයෙන් ඔබ ඉවත්වන්න. ආරක්ෂිත ස්ථානයක් සොයා යන්න.

**දැනුම් දෙන්න !**

දරුවන් හිංසනයන්ගෙන් ආරක්ෂා වී ඇති බව තහවුරු කිරීම තම වෘත්තිය කරගත් පිරිස් ඔබේ ප්‍රජාවේ සිටී. ඔබට විශ්වාසවන්ත එවන් පුද්ගලයෙකු සොයා ඔබේ කාරණය පවසන්න. ඔබව ආරක්ෂා කිරීමට ඔවුන් කළ හැකි උපරිම දෙය කරනු ඇත.

## ඔබේ ප්‍රජාවේ පවතින සම්පත්

දැන් ඔබ ළමයින්ට සිදුවන හිංසනයන් ගැන, එය සිදුවන ස්ථාන සහ සිදුවන විවිධ ආකාර ගැන ඉගෙනීමක් ලබා ඇත. ඔබට උපකාර ලබා ගත හැකි අයගේ නම් සහ දුරකථන අංක පහත සඳහන් කරන්න.

...........................................................................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................